# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1792/53 - 2013 ජනවාරි මස 11 වැනි සිකුරාදා - 2013.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

1 වැනි උපලේඛනයේ 3 වැනි අයිතමය යටතේ නියෝගය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1 වැනි උපලේඛනයේ 3 වැනි අයිතමයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදුලිබල හා බලශක්ති අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි, මේ නියෝගය මගින් -

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයට, මේ නියෝගයේ උපලේඛනයේ දැක්වෙන ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වී ඇති බවට ; සහ

(ආ) එම ඉඩම (460 වන අධිකාරය වූ) ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ අත්පත් කරගනු ලැබීමෙන් අනතුරුව ලංකා විදුලිබල මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිය හැකි බවට ද,

අනුමත කරනු ලැබේ.

පාඨලී චම්පික රණවක,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2013 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාවේ, දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහඳ ගමේ, අංක 167 ඒ කහඳ අතිරේක ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි රිලාමුල්ලගොඩ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්.එල්.ආර්. ජයසුන්දර විසින් මැන සාදන ලද 2003.05.29 දිනැති සහ අංක 1182 දරන පිඹුරෙහි දක්වා ඇති කැබලි අංක 6,9 සහ 10 දරන පහත සඳහන් පරිදි මායිම් වූ හෙක්ටයාර් 0.075 ක් වූ මුළු බිම් ප්‍රමාණය :–

01. **කැබලි අංක 6 – රිලාමුල්ලගොඩ නමැති ඉඩම – බිම් ප්‍රමාණය ඃ හෙක්ටයාර් 0.025**

*උතුරට* : මෙම ඉඩමේ කැබලි අංක 9 ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ පාරක් සඳහා වෙන්කළ කැබලි අංක 17 ;
*දකුණට* : මෙම ඉඩමේ කැබලි අංක 5 ;
*බටහිරට* : මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල.

හිමිකම් කියන අය ඃ අඟුළුගහ ගමගේ ලසත් නාමල්

02. **කැබලි අංක 9 – රිලාමුල්ලගොඩ නමැති ඉඩම – බිම් ප්‍රමාණය : හෙක්ටයාර් 0.025**

*උතුරට* : මෙම ඉඩමේ කැබලි අංක 10 ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ පාරක් සඳහා වෙන්කළ කැබලි අංක 17 ;
*දකුණට* : මෙම ඉඩමේ කැබලි අංක 6 ;
*බටහිරට* : මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල.

හිමිකම් කියන අය : අඟුළුගහ ගමගේ ලසත් නාමල්

03. **කැබලි අංක 10 – රිලාමුල්ලගොඩ නමැති ඉඩම – බිම් ප්‍රමාණය : හෙක්ටයාර් 0.025**

*උතුරට* : මෙම ඉඩමේ කැබලි අංක 11 ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ පාරක් සඳහා වෙන්කළ කැබලි අංක 17 ;
*දකුණට* : මෙම ඉඩමේ කැබලි අංක 9 ;
*බටහිරට* : මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල.

හිමිකම් කියන අය : අඟුළුගහ ගමගේ ලසත් නාමල්

01-773

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.